# බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව
යොමු අංකය : බප/පරිළසේ/ආ04/වෘ.උ. දිනය : 2013.01.21

1.2 අමාත්‍යාංශය : බස්නාහිර පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්‍ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : ඩබ්පීඑච්/ආ05/පරි/බ.ගැ./09 දිනය : 2013.01.21

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය - ඩීඑම්එස්/ඩී/පොදු/11-2 දිනය : 2012.12.19

1.4 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : දිනය :

1.5 ප්‍රධාන ලේකම් (බ.ප) නිර්දේශය :
යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : දිනය :

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :
යොමු අංකය : දිනය :

02. පත්කිරීමේ බලධාරියා - බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කල දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය - කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි - 111, 11, 1

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්‍ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකල ස්වරූපයේ වූද, කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත් කිරීම් බලධාරියා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධාරීන් විසින් ඉටු කල යුතුය.

3.4 කාර්යයන් පැවරීම - පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස් (බ.ප)

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. අංකය : ... දිනය ... 2013/03/11

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය - MN- 1-2006 A (රා.ප.ච.6/2006(iv) අනුව)

5.2 වැටුප් පරිමාණය - රු. 13,120-10x145-11x170-10x240-10x320- රු. 22,040 (කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් කේත අංකයන් වෙනස් විය හැකිය)

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| 111 | පියවර 01 | 13,120 |
| 11 | පියවර 12 | 14,740 |
| 1 | පියවර 23 | 16,680 |

සටහන :

කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් පරිමාණයන් වෙනස් විය හැකිය.

06. සේවා ගණයට අයත් තනතුරු / තනතුර :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවෙරන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වෘත්තීය උපදේශක | 111/11/1 | 12 | බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහතික කල පාසැල් වෙත තුන් අවුරුදු කාල සීමාවකට යොමු කරන සෑම ළමයකු සඳහාම අවශ්‍ය රැකවරණය, අධ්‍යාපනය, පුහුණුව ලබාදීම හා ස්වකීය හැසිරීම් රටාව වැඩි දියුණු කර සමාජයේ නැවත වාසය කිරීමට පහසුවන පරිදි මෙම විශේෂිත වූ ළමුන් වෘත්තීය අධ්‍යාපනය තුළින් පුනරුත්තාපනය කිරීමට සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම. |

සටහන :

පළාත් රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම සංඛ්‍යාව වෙනස් විය හැකිය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 12

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය [illegible] දිනය : 2013/03/31

07. බඳවා ගැනීමේ ක්‍රමය :

පළමුව සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති විටක පමණක් විවෘතව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම් :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය - 111 ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

i. අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයන් 06 කින් සමත් වී තිබීම. ඉන් විෂයන් 05 ක් එකවර සමත්ව තිබීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තිමය සුදුසුකම් :

අදාල වෘත්තිය සම්බන්ධයෙන් ඇමුණුම් අංක 01 හි සඳහන් පරිදි පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

7.2.2.3 පලපුරුද්ද :

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

7.2.2.4 කායික සුදුසුකම් :

i. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍යය තත්වයකින් යුක්ත විය යුතුය.

ii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ගරු ... විසින් අනුමත කරන ලදී.
... 15/223 දිනය : 2013/03/11

7.2.2.5 වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 3 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 22

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 40

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට නොහැකි අවස්ථාවක් ඇති වුවහොත් පත්කිරීම් බලධරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් පල කිරීම මගින් ඉහත 7.2.2 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර අදාල පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය ඇමුණුම් අංක 02 හි සඳහන් කර ඇත)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අභියෝගාත්මතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | 100 | 40 |

7.2.4.1.1 ලිඛිත පරීක්ෂණය පවත්වන බලධරයා : පත්කිරීම් බලධාරියා

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

විසින් අනුමත කරන ලදී. ... 2013/03/11

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ඉහත 7.2.4.1 ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙල මත ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා ඉහළම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර ඇමුණුම් අංක 03 යටතේ සඳහන් කර ඇත.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 100 | 50% |

සටහන :

මෙම සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව පළ කරනු ලබන නිවේදනයේ/ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා තනතුරට අදාල රාජකාරි ඉටුකිරීමට සුදුසු කායික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්න පිළිබඳවද පරීක්ෂා කර බැලෙනු ඇත.

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධාරියා

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් හෝ ප්‍රසිද්ධ නිවේදනයක් පලකිරීම මගිනි.

7.3 සීමිත බඳවා ගැනීම :

මෙම තනතුර සඳහා ප්‍රථමයෙන් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය - 111 ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයන් 06 කින් සමත්ව තිබීම. ඉන් විෂයන් 05 ක් එකවර සමත්ව තිබීම.

7.3.2.2 වෘත්තීමය සුදුසුකම් :

අදාල වෘත්තිය සම්බන්ධයෙන් ඇමුණුම් අංක 01 හි සඳහන් කර ඇති පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

7.3.2.3 පලපුරුද්ද : අදාල නොවේ

7.3.2.4 කායික සුදුසුකම් :

i. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍යය තත්වයකින් යුක්ත විය යුතුය.

ii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 3 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

ii. පූර්වාසන්න වසර 03ක කාලසීමාව තුල විනය ක්‍රියා මාර්ගයකට ලක් නොවී සිටිය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.3.3 වයස :

7.3.3.1 අවම සීමාව : අවුරුදු 24

7.3.3.2 උපරිම සීමාව : දැනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ,

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා ඉහළම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර ඇමුණුම් අංක 04හි සඳහන් කර ඇත.

...රු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
...ආ.ප./223 දිනය : 2013/03/11

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් | 25 | 50% |
| 2. කාර්යය සාධනය ඇගැයීම | 35 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 40 | |
| එකතුව | 100 | |

සටහන :

මෙම සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව පළ කරනු ලබන නිවේදනයේ/ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා තනතුරට අදාල රාජකාරී ඉටුකිරීමට සුදුසු කායික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්න පිළිබඳවද පරීක්ෂා කර බැලෙනු ඇත.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධාරියා

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර දැන්වීම, රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ නිවේදනයක් පල කිරීම මගිනි.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම් : අදාල නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම් විභාග :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 111 වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | ඇමුණුම 05 බලන්න |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 11 වන ශ්‍රේණියට උසස්වී වසර තුන (03) ක් ගතවීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | ඇමුණුම 06 බලන්න |

...ණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද:

යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක්වත් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද:

කාර්යක්ෂමතා කඩඉම් විභාග පත්වීම් බලධරයා විසින් හෝ පත්වීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

09. භාෂා ප්‍රවීණතාවය :

9.1

| භාෂාව | ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. රාජ්‍ය භාෂාව | 111 | සේවයට බැදී ඇත්තේ රාජ්‍ය භාෂාවකින් නොවේ නම් පරිවාස කාලය තුල රාජ්‍ය භාෂාවක ප්‍රවීනතාවය ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | 111 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාල නොවේ | |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 වෘත්තිය උපදේශක තනතුරේ 111 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණියට උසස් කිරීම :

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම :

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. උසස් කිරීම සදහා සුදුසුකම් ලබන දිනට වෘත්තිය උපදේශක තනතුරේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාව තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර දහයක් (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

vi. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
... අංකය ...ප/23 දිනය ...2013/03/11

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සපුරන නිලධාරීන් 11 ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්වීම් බලධාරියා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘති පත්‍රය මඟින් පත් කිරීමේ බලධාරියා වෙත අදාල නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව, ඉහත සුදුසුකම් සපුරාලන දිනය හෝ 111 ශ්‍රේණියේ වසර දහයක (10) ක සේවා කාලය සම්පූරණ කරනු ලබන දිනය යන දෙකෙන් පසුව එලඹෙන දින සිට 11 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.1.2. සුවිශේෂි කාර්ය සාධනය අනුව උසස් කිරීම.

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට වෘත්තිය උපදේශක තනතුරේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාව තුල සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර හය (06) ක් තුලම සුවිශේෂි කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාල මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.
vi. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කර අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්කිරීමේ දින සිට වසර 06ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුවිශේෂි ක්‍රමය යටතේ 11 ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

...කොමසාරිස්තුමා විසින් අනුමත කරන ලදී. ...දිනය : 2013/03/11

සටහන :

i. සුවිශේෂී කාර්ය සාධනය යටතේ 11 වන ශ්‍රේණියට උසස් වීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්‍ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබා ගත යුතුය. තවද සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්‍ෂණය සඳහා නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි. (විභාග විෂය නිර්දේශය ඇමුණුම් අංක 07 යටතේ දක්වා ඇත)

ii. නිලධරයකුට පාලනය කල නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්‍ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගාත්මක පරීක්‍ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

10.2 වෘත්තීය උපදේශක තනතුරේ 11 වන ශ්‍රේණියේ සිට 1 වන ශ්‍රේණියට උසස් කිරීම :

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට වෘත්තීය උපදේශක තනතුරේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාව තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර දහයක් (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත්ව තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සපුරන නිලධාරින් 1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්වීම් බලධාරියා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත අදාල නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කර බැලීමෙන් අනතුරුව, ඉහත සුදුසුකම් සපුරාලන දිනය හෝ 11 ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දෙකෙන් පසුව එලඹෙන දින සිට 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
2013/03/11

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම :

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට වෘත්තීය උපදේශක තනතුරේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නමයක (09) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාව තුල සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව පූර්වාසන්න වසර නමයක් (09) තුලම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් පත් කිරීමේ බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කර අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් 11 ශ්‍රේණියට උසස් වී වසර නවයක් (09) සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුවිශේෂී ක්‍රමය යටතේ 1 ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

සටහන :

i. සුවිශේෂී කාර්ය සාධනය යටතේ 1 වන ශ්‍රේණියට උසස් වීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුය. තවද සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය සඳහා නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි. (විභාග විෂය නිර්දේශය ඇමුණුම් අංක 08 යටතේ දක්වා ඇත)

ii. නිලධරයකුට පාලනය කල නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

සංලක්ෂය : 1. සුවිශේෂි කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂි කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගාත්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

11. තනතුරු වලට පත්කිරීම : අදාල නොවේ

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ආයතන සංග්‍රහය/බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. අන්තර්ග්‍රහණය කිරීම :

14.1 111 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට සේවයේ යෙදී සිටින වසර දහයක (10) ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් 111 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. වසර දහයක (10) ක සේවා කාලයක් සපුරා ඇති එහෙත් සේවය ස්ථිර කර නොමැති හෝ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත් වී නොමැති නිලධාරීන් ද 111 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද. ...2013/03/11

14.2 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට වසර දහයකට (10) කට වැඩි සේවා කාලයක් සපුරා ඇති වසර විස්සක (20) සේවා කාලයක් සපුරා නොමැති, සේවය ස්ථිර කර ඇති, දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ඇති හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත් වී ඇති නිලධාරින් 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. වසර විස්සකට (20) වැඩි සේවා කාලයක් සපුරා ඇති එහෙත් සේවය ස්ථිර කර නොමැති හෝ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත් වී නොමැති නිලධාරින්ද 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. පැරණි බඳවා ගැනීමේ පරිපාටිය යටතේ වසර දහයක් (10) ක් ඉක්මවා සේවය කර ඇති කාල සීමාව නව බඳවා ගැනීමේ පරිපාටියේ දෙවන ශ්‍රේණියේ සේවා කාලය ලෙස සැලකේ.

14.3 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්, සේවය ස්ථිර කර ඇති, වසර විස්සකට (20) වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරින් 1 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. පැරණි බඳවා ගැනීමේ පරිපාටිය යටතේ වසර විස්සක් (20) ක් ඉක්මවා සේවය කර ඇති කාලසීමාව නව බඳවා ගැනීමේ පරිපාටියේ පළමුවන ශ්‍රේණියේ සේවා කාලය ලෙස සැලකේ.

සටහන : දැනට සේවයේ යෙදී සිටින නිලධාරින් ඒ ඒ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ පසු එම ශ්රේණියේ කාර්යක්‍ෂමතා කඩ ඉම් පරීක්‍ෂණය සමත් විය යුතුය. ඒ සඳහා එම නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 15 වගන්තියේ විධි විධාන යටතේ විභාග අවස්ථා තුනක (03) ක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම සහන කාලය ඇතුළත නව පරිපාටියේ සඳහන් පරිදි කාර්යක්‍ෂමතා කඩඉම් වලින් සමත් විය යුතු අතර එසේ සමත් වන නිලධාරීන් නව පරිපාටිය අනුමත වූ දින සිට එය සමත් වූවා සේ සැලකේ. පැරණි පරිපාටිය යටතේ නියමිත ශ්‍රේණි වලට අදාලව දැනටමත් කාර්යක්‍ෂමතා කඩඉම් සමත් නිලධාරින් නව පරිපාටිය යටතේ ඉන් සමත් වූවා සේ සැලකේ.

14.4 සේවයට අන්තර්ග්‍රහණය කිරීම මත නිළධාරින්ගේ අදාල වැටුප :

පැරණි බඳවා ගැනීම් පරිපාටිය යටතේ බඳවා ගන්නා ලද නිලධාරින් ඉහත 14.1, 14.2 සහ 14.3 අනුව අන්තර්ග්‍රහණය කිරීම මත එම නිලධාරින්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

සටහන : ඉහත තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන් නියමිත දිනදී අදාල පංති වල/ ශ්‍රේණි වල ඒ ඒ නිලධාරීන් හට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද.
...223 දිනය : 2013/03/11

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තිරණය කරනු ඇත.

16. අර්ථ නිරූපන :

i. සතුටුදායක සේවා කාලය :

"සතුටුදායක සේවා කාලයක්" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුලදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

ii. සක්‍රිය සේවා කාලය :

"සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

iii. නියමිත දිනට

අදාල කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

උදා : වසර තුනකදී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස්වීම ලැබෙනුයේ වසර එකොළහකිනි.

...ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
...දිනය :..2013.03.11

17. උපලේඛන

| ඇමුණුම් | විස්තරය |
|---|---|
| ඇමුණුම් 01 | වෘත්තීය උපදේශක තනතුර සඳහා ඒ ඒ වෘත්තීයට අදාලව බඳවා ගැනීමේ සුදුසුකම් |
| ඇමුණුම් 02 | වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගයේ විෂය නිර්දේශය |
| ඇමුණුම් 03 | වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (විවෘත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය. |
| ඇමුණුම් 04 | වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (සීමිත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය. |
| ඇමුණුම් 05 | පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය |
| ඇමුණුම් 06 | දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය |
| ඇමුණුම් 07 | සුවිශේෂී කාර්යසාධනය මත වෘත්තීය උපදේශක තනතුරේ 11 වන ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගයේ විෂය නිර්දේශය |
| ඇමුණුම් 08 | සුවිශේෂී කාර්යසාධනය මත වෘත්තීය උපදේශක තනතුරේ 1 වන ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගයේ විෂය නිර්දේශය |
| ඇමුණුම් 09 | ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත්‍රය |

සකස් කලේ - අත්සන ..............................

පරීක්ෂා කලේ - ..............................

(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

ආර්. ඩී. ජමින්ද
සහකාර ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

ආර්.ඩී. ජමින්ද,

සහකාර ලේකම්,

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව :

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය බ.ආ. 6/223 දිනය : 2013/03/11

යොමු අංකය : ඩබ්පීඑච්/ආ5/පරි/බ.ගැ/07

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි වෘත්තීය උපදේශක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :............................................

නම :එම්.සී.එල්. රුද්‍රිගෝ

ලේකම්

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,

කාන්තා කටයුතු, පරිවාස හා ළමා

රක්‍ෂක සේවා සහ සභා කටයුතු

අමාත්‍යාංශය (බ.ප)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව :
එම්. සී. එල්. රුද්‍රිගෝ
ලේකම්
සෞඛ්‍ය, දේශීය, වෛද්‍ය, සමාජ සුභසාධන හා
කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ
සභා කටයුතු අමාත්‍යාංශය බස්නාහිර පළාත
අංක. 175, ස්ටැන්ලි තිලකරත්න මාවත
නුගේගොඩ.

යොමු අංකය :1/5/5/6 (:)

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි වෘත්තීය උපදේශක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :............................................

නම :............................................

ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය 2013.02.22

නිල මුද්‍රාව :
ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (වැ.ආ)
බස්නාහිර පළාත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :බ.ආ.ප.1223 දිනය :2013/02/21

යොමු අංකය :............................................

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි වෘත්තීය උපදේශක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන :............................................

නම :............................................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

දිනය ......................................

නිල මුද්‍රාව

යොමු අංකය :..බ.ප.ව./223..................

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි වෘත්තීය උපදේශක තනතුර තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය ..2013..03..11............ දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන :............................................

නම :............................................

ආණ්ඩුකාර ලේකම් (බ.ප)

දිනය ..........2013 | 3 | 11.......

නිල මුද්‍රාව

බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
88/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.
යොමු අංකය : බ/ප/ව/223 දිනය : 2013/03/11

ඇමුණුම - 01

## බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක 111 තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම්

(1) වෙල්ඩින් වෘත්තිය පිළිබඳ උපදේශක

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුනු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක වෙල්ඩින් වෘත්තිය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

(2) විදුලි වෘත්තිය පිළිබඳ උපදේශක

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුනු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක විදුලි වෘත්තිය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

(3) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පය පිළිබඳ උපදේශක

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
තීරණ අංකය : බ.ප.ආ.ස. 223 දිනය : 2013/02/11

**(4)** <u>පෙදරේරු ශිල්පය පිළිබඳ උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක පෙදරේරු ශිල්පය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

**(5)** <u>මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය,අර්ධ රාජ්‍ය,හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

(6) <u>කෘෂි කර්මය පිළිබඳ උපදේශක</u>

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති කෘෂිකර්ම විද්‍යාලයක හෝ අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික විද්‍යාලය, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයෙහි කෘෂිකර්මය පිළිබඳ වසර දෙකකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

**(7)** <u>අධිවේගී හා සාමාන්‍ය මැහුම් වැඩ පිළිබඳ උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක අධිවේගී හා සාමාන්‍ය මැහුම් වැඩ පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය,අර්ධ රාජ්‍ය,හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

ගුරු ආණ්ඩුකාරයුමා විසින් අනුමත කරන ලද 2013/03/4)

(8) <u>පරිගණක එකලස් කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක පරිගණක එකලස් කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

- රාජ්‍ය,අර්ධ රාජ්‍ය,හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

(9) <u>බේකරි නිශ්පාදන පිළිබඳ වෘත්තීය උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක බේකරි නිෂ්පාදනය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි

(10) <u>රූපලාවන්‍ය පිළිබඳ වෘත්තීය උපදේශක</u>

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක රූපලාවන්‍ය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
2013/03/11

**(11) <u>ජුකී මැහුම් පිලිබඳ උපදේශක</u>**

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි පුහුණු ආයතනයක ජුකී මැහුම් පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවුරුදු දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

**(12) <u>ගෘහ විද්‍යාව පිළිබඳ උපදේශක</u>**

- අ.පො.ස(සා.පෙළ) විභාගයට ගෘහ විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

සහ

- ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

- දෙහිවල බහු තාක්ෂණික ආයතනයේ ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ එක් වසරක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(13) <u>අත්කම් පිළිබඳ උපදේශක</u>

- අ.පො.ස(සා.පෙළ) විභාගයට ගෘහ විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

සහ

- ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන අත්කම් පිළිබඳ මාස 06කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

ඇමුණුම - 02

<u>**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය**</u>

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට බඳවා ගැනිමේ ලිඛිත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය / විෂය ක්ෂෙත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාව හා බුද්ධි පරික්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අභියෝග්‍යතාව හා බුද්ධි පරික්ෂණය | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතම හැකියාව පරික්ෂා කිරිම සඳහා සකස් වූවකි. |
| 2. සාමාන්‍ය දැනීම | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කල ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

අත්සන ...................................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව : සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

...ධිකාරතුමා විසින් අනුමත කරන ලදී.
...5/2.2.3 දිනය :- 2013.03.11

ඇමුණුම 03

<u>බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (විවෘත) ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය.</u>

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (විවෘත) ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය

02. සම්මුඛ පරීක්‍ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්‍ෂෙත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

මෙම පරිපාටියේ 7.2.4.4 යටතේ පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ ලකුණු ලබා දෙන ක්‍ෂෙත්‍ර

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය<br>(වයස් මට්ටම් අනුව ළමුන්ගේ කායික හා මානසික චර්යාවන්, ළමා පෝෂණය හා සෞඛ්‍යය, ළමා රැකවරණය,ළමා අයිතිවාසිකම්, පිළිබඳ දැනුමද, ළමුන් සමග කටයුතු කල යුතු ආකාරය පිළිබඳ අයදුම්කරු තුල තිබිය යුතු ආකල්ප/ අවබෝධයද පරීක්ෂා කරනු ලැබේ) | 100 | 50 |

03. සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

...ණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ...2013/02/11 දිනය ...2013/03/11

සටහන:

මෙම තනතුර අතිශයින් සංවේදීව කටයුතු කල යුතු ළමයින්ගේ චර්යා පාලනයට සෘජුව අදාල වන තනතුරකි. මෙම පරිපාටියේ 7.2.2 හි සඳහන් අයදුම්කරුවන් හා 7.2.4.1 හි සඳහන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත ප්‍රශ්න පත්‍රයට 50 % ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගත්තා වූද, පත්වීම් බලධාරයා විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූද, අපේක්ෂකයින් පමණක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. මෙම බඳවා ගැනීම් පරිපාටියේ 7.2.4.4 ඡේදයේ සඳහන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්, මෙම තනතුරට අදාල රාජකාරි ඉටු කිරිමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා නිශ්චිත ලකුණු ප්‍රමාණයක් දිය යුතුය. ළමා හිමිකම්/අයිතින්, ළමයින්ගේ මානසික තත්ත්වය හා ඊකවරණය පිළිබඳ අත්දැකීම් හා ගැඹුරු දැනුමක් ඇති තිදෙනෙකුට නොඅඩු විද්වත් මණ්ඩලයක් පත්වීම් බලධාරයා විසින් පත්කොට ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය. පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියා විසින් ලකුණු ලබා දීමක් සිදු නොකල යුතු අතර අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය හා සහතික පරීක්ෂා කිරිමේ කාර්යයේ පමණක් නිරත විය යුතුය.

| | | | |
|---|---|---|---|
| සකස් කලේ - අත්සන | :................................ | පරීක්ෂා කලේ - අත්සන | :................................ |
| | (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම | :කේ.එම්.එන්. වික්‍රමසිංහ | නම | : ආර්.ඩී. ජමින්ද |
| තනතුර | :පරිපාලන නිලධාරී | තනතුර | : සහකාර ලේකම් |
| දිනය | :2013.01.21 | දිනය | : 2013.01.21 |

කේ. එම්. එන්. වික්‍රමසිංහ
පරිපාලන නිලධාරී
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශය
බස්නාහිර පළාත

ආර්. ඩී. ජමින්ද
සහකාර ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

| | |
|---|---|
| අත්සන | :................................ |
| | (දෙපාර්තමේන්තු ප්‍රධානි) |
| නම | : සුගත් එස්. කුමාර |
| තනතුර | : පරිවාස කොමසාරිස් (වැ.බ) |
| දිනය | : 2013.01. 21 |
| නිල මුද්‍රාව | : |

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
... දිනය : 2013/03/11

ඇමුණුම 04

<u>**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (සීමිත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය.**</u>

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීමේ (සීමිත)ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

මෙම පරිපාටියේ 7.3.4.4 යටතේ පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| 1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයක් සඳහා ලකුණු 5 බැගින්) | 25 | |
| 2. කාර්යය සාධනය ඇගැයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා) ඉතා හොඳයි - ලකුණු 07 හොඳයි - ලකුණු 05 සතුටුදායකයි - ලකුණු 03 | 35 | 50 |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය (වයස් මට්ටම් අනුව ළමුන්ගේ කායික හා මානසික චර්යාවන්, ළමා පෝෂණය හා සෞඛ්‍යය, ළමා රැකවරණය, ළමා අයිතිවාසිකම්, පිළිබඳ දැනුමද, ළමුන් සමග කටයුතු කල යුතු ආකාරය පිළිබඳ අයදුම්කරු තුල තිබිය යුතු ආකල්ප/ අවබෝධයද පරීක්ෂා කරනු ලැබේ) | 40 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

සටහන:

මෙම තනතුර අතිශයින් සංවේදීව කටයුතු කල යුතු ළමයින්ගේ චර්යා පාලනයට සෘජුව අදාල වන තනතුරකි. මෙම බඳවා ගැනීම් පරිපාටියේ 7.3.4.4 ඡේදයේ සඳහන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්, මෙම තනතුරට අදාල රාජකාරි ඉටු කිරිමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා නිශ්චිත ලකුණු ප්‍රමාණයක් දිය යුතුය. ළමා හිමිකම්/අයිතීන්, ළමයින්ගේ මානසික තත්ත්වය හා ඨකවරණය පිළිබඳ අත්දැකීම් හා ගැඹුරු දැනුමක් ඇති තිදෙනෙකුට නොඅඩු විද්වත් මණ්ඩලයක් පත්වීම් බලධාරයා විසින් පත්කොට ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය. පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියා විසින් ලකුණු ලබා දීමක් සිදු නොකල යුතු අතර අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය හා සහතික පරීක්ෂා කිරිමේ කාර්යයේ පමණක් නිරත විය යුතුය.

| | | | |
|---|---|---|---|
| සකස් කලේ - අත්සන | :.................... | පරීක්ෂා කලේ - අත්සන | :.................... |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | |
| නම | :කේ.එම්.එන්. වික්‍රමසිංහ | නම | : ආර්.ඩී. ජමින්ද |
| තනතුර | :පරිපාලන නිලධාරි | තනතුර | : සහකාර ලේකම් |
| දිනය | :2013.01. 21 | දිනය | : 2013.01. 21 |

ආර්. ඩී. ජමින්ද
සහකාර ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

අත්සන :....................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව :

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ඇමුණුම - 05

<u>**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුරට අදාල පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය**</u>

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ගුරු වෘත්තීය උපදේශක තනතුරට අදාල පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය / විෂය ක්ෂෙත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40 |
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | විෂය ක්ෂෙත්‍රයට අදාල වෘත්තිය දැනුම මැන බැලීම. |
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX, XLVII පරිච්ඡේද හා එම පරිච්ඡේද වලට අදාලව චක්‍රලේඛ මඟින් පසුකාලීනව සිදු කරන ලද සංශෝධන ඇසුරින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |

සටහන :

1. තනතුරට බඳවා ගැනීමට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ.
2. තනතුරේ III වැනි ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.
3. සියලු විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට අවසර ඇත.

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම සුගත් එස්. කුමාර

තනතුර පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය 2013.01. 21

නිල මුද්‍රාව සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ඇමුණුම - 06

## බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුරට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක තනතුරට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය | පැය 02 | 100 | 40 |
| ආයතන සංග්‍රහය හා පළාත් මුල්‍ය රීති | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය | • නොවිධිමත් අධ්‍යාපන ක්‍රම පිළිබඳ අවබෝධය<br>• ළමා මනෝ විද්‍යාව,අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳ දැනුම |
| ආයතන සංග්‍රහය හා පළාත් මුල්‍ය රීති | ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය රීති පිළිබඳ සාමාන්‍ය දැනීම (ආයතන සංග්‍රහයේ XV, XVI, XXIV, XXVII, XXVIII, XLVII, XLVIII හා මුල්‍ය රීති 130 – 196 දක්වා, 215 – 244 දක්වා, 527, 541, 560 – 562 දක්වා වන පරිච්ඡේද හා එම පරිච්ඡේද වලට අදාලව චක්‍රලේඛ මගින් පසුකාලීනව සිදු කරන ලද සංශෝධන ඇසුරින්) |

සටහන :

1. තනතුරට බඳවා ගැනීමට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ.
2. තනතුරේ II වැනි ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.
3. සියලු විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට අවසර ඇත.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව :

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ඇමුණුම - 07

**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ උපදේශක (වෘත්තීය උපදේශක) තනතුරට අදාල සුවිශේෂි කාර්ය සාධනය මත 11 වන ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට අදාල සුවිශේෂි කාර්ය සාධනය මත 11 වන ශ්‍රේණියට උසස් කිරිමේ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය / විෂය ක්ෂෙත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග | පැය 02 | 100 | 60 |

03. පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග | දෙපාර්තමේන්තුව යටතේ පවතින සහතික කල පාසල්,රැඳවුම් නිවාස, රජයේ ළමුන් භාර ගැනිමේ මධ්‍යස්ථානය සම්බන්ධව පනවා ඇති ස්ථාවර නියෝග පිළිබඳ සාමාන්‍ය දැනුම |

අත්සන :............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව :

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට අදාල සුවිශේෂී කාර්ය සාධනය මත 1 වන ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට අදාල සුවිශේෂී කාර්ය සාධනය මත 1 වන ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය / විෂය ක්‍ෂෙත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ප්‍රඥප්ති හා අණ පනත් | පැය 02 | 100 | 50 |

03. පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් හෝ පත් කිරීමේ බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රඥප්ති හා අණපනත් | • ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත / ප්‍රඥප්තිය<br>• වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥා පනත / ප්‍රඥප්තිය<br>• තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත / ප්‍රඥප්තිය<br>• 2008 අංක 01 දරණ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ප්‍රඥප්තිය<br>• විශ්ව ළමා ප්‍රඥප්තිය පිළිබඳ අවබෝධය. |

අත්සන : ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.01. 21

නිල මුද්‍රාව : සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

**බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරට අදාල සාමාන්‍ය කාර්ය සාධනය/ සුවිශේෂි කාර්ය සාධනය යටතේ 11/ 1 ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා අයදුම්පත්‍රය**

**1. නිළධරයා පිළිබඳ තොරතුරු**

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :...............................................................................

1.2 හැදුනුම්පත් අංකය :...............................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය :...............................................................................

1.4 අයත්වන සේවය හා තනතුර :...............................................................................

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය:...............................................................................

**2. පත්වීම පිළිබඳ තොරතුරු**

2.1 පත්වීම් දිනය ...............................................................................

2.2 පත්වීම ස්ථිර කල දිනය :...............................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

**3. උසස් වීමට අදාල තොරතුරු**

3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11 / 1

3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය / සුවිශේෂි

3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද ? ඔව් / නැත

3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කල දිනය : ..................................................

3.2.3 අපේක්ෂිත සක්‍රීය සේව කාලය තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද ? ඔව් / නැත

3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද ? ඔව් / නැත

3.2.5 උසස් වීමට පූර්වාසන්න පස් වසර තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද ?

ඔව් / නැත

3.2.6 විනය දඬුවම් ලබා තිබේද ? ඔව් / නැත

3.2.7 සුවිශේෂි කාර්ය සාධනය යටතේ වූ ලිඛිත විභාගය සමත් වූ දිනය : ................................

3.2.8 විභාගයේදී ලකුණු ලබා ගත් ප්‍රමාණය :........................................

3.2.9 සුවිශේෂි කාර්ය සාධනය යටතේ වූ ලිඛිත විභාගයට පෙනී සිටි වාර ගණන : ..................

3.2.10 නියමිත දිනට සුවිශේෂි කාර්ය සාධනය සඳහා වූ අභියෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට නොහැකි වූයේ නම් ඊට හේතු :......................................................................

**4. අයදුම්කරුගේ ප්‍රකාශය**

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධ නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................... දින සිට සාමාන්‍ය කාර්ය සාධනය/ සුවිශේෂි කාර්ය සාධනය යටතේ 11/ 1 ශ්‍රේණියට උසස් වීමට අදාල සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය :.....................................

..........................................
(නිලධාරියාගේ අත්සන)

## 5. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ........................................................ මහතා/මෙනවිය/මහත්මිය ................................................ සේවා ගණයේ ................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :............................................

අත්සන :............................................

දිනය :............................................

නිල මුද්‍රාව :............................................

## 6. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ........................................................ මහතා/මෙනවිය/මහත්මිය ................................................ සේවා ගණයේ ................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :............................................

අත්සන :............................................

දිනය :............................................

නිල මුද්‍රාව :............................................

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. 2013/03/11

**7. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය/අනුමැතිය</u>**

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ...................................................... මහතා/මෙනවිය/මහත්මිය ................................................ සේවා ශ්‍රේණියේ .................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ ............................ දින සිට උසස් කිරීම අනුමත කරමි.

නම :............................................

අත්සන :............................................

දිනය :............................................

නිල මුද්‍රාව :..........................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :